# ග්‍රාමීය මහජන මතය සහ ඡන්දදායක චර්යාව හැඩගැස්වීමෙහිලා විද්‍යුත් රාජ්‍ය මාධ්‍යයෙහි බලපෑම.

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

*ආර්.එම්.ඒ.ආර්. රත්නායක*[1]
*එම්.කේ. නදීකා දමයන්ති* [2]

සංක්ෂේපය

ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා අත්හළ නොහැකි වගකීමක් ජනමාධ්‍ය වෙත පැවරේ. සමාජ, ආර්ථික මෙන්ම දේශපාලන තොරතුරු ජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් ද ජනතා අදහස් පාලන තන්ත්‍රය වෙත ගෙන යාම සම්බන්ධයෙන් ද ජනමාධ්‍ය පුළුල් කාර්ය භාරයක් ඉටු කරයි. දේශපාලන සමාජානුයෝජක කාරකයක් ලෙස ද මාධ්‍ය කටයුතු කරන අතර මහජන මතය තීරණය වීම සම්බන්ධයෙන් ද මාධ්‍ය වැදගත් වේ. මෙහිදි ඉතා වැදගත් ස්ථානයක් රූපවාහිනි මාධ්‍යයට හිමි වේ.

කෙසේ වුවද, මැතිවරණ සමය තුළදී ජනමාධ්‍ය භූමිකාව සහ වගකීම පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ඇතැම් විට මාධ්‍ය විසින් දේශපාලනික වශයෙන් පක්ෂපාතීත්වයක් දැරීම සිදුවන බවට චෝදනා එල්ල වේ. මාධ්‍යවල පක්ෂපාතීත්වය මහජන මතය මෙන්ම ඡන්දදායකයින්ගේ හැසිරීම හැඩගැස්වීම සඳහා බලපෑම් කරනු ලබයි. 2015 ජනාධිපතිවරණයේ දී රාජ්‍ය මාධ්‍යයේ ක්‍රියාකාරීත්වය ග්‍රාමීය මහජන මතය කෙරෙහි බලපෑම් සිදුකළ අයුරු විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. වර්තමානය වනවිට රාජ්‍ය අංශයේ විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය රාශියක් පවතින අතර මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික සහ ද්විතීයික දත්ත භාවිත කෙරෙණි. ප්‍රාථමික දත්ත රැස් කිරීමේ දී හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හපුතලේ ග්‍රාම නිලධාරී වසමෙහි පුද්ගලයින් 100ක් සිංහල, දෙමළ සහ මුස්ලිම් යන ත්‍රිවිධ ජන වර්ග නියෝජනය වන පරිදි අහඹු ලෙස තෝරා ගන්නා ලදි. දත්ත විශ්ලේෂණයේ දී ප්‍රමාණාත්මක දත්ත සඳහා සරල සංඛ්‍යානමය විධික්‍රමය ද ගුණාත්මක දත්ත සඳහා විස්තරාත්මක සහ සන්සන්දනාත්මක ක්‍රමවේදය ද භාවිත කරනු ලැබිණි.

අධ්‍යයනයේ ප්‍රතිඵල තුළින් පෙන්නුම් කරන්නේ රූපවාහිනිය පමණක් භාවිතා කරන ප්‍රතිචාරීන්ගේ ප්‍රතිශතය 39%ක් ද රූපවාහිනිය සහ ගුවන්විදුලිය යන මාධ්‍ය දෙකම භාවිතා කරන ප්‍රතිශතය 45%ක් වන බවයි. රූපවාහිනිය, ගුවන්විදුලිය සහ අන්තර්ජාලය භාවිතා කරන ප්‍රතිශතය 8%කි. 65% ක් ජාතික රූපවාහිනිය සහ ස්වාධීන රූපවාහිනිය නරඹන නමුත් ඔවුන්ගෙන් අතිබහුතරය දේශපාලන සංවාද සහ ප්‍රවෘත්ති නැරඹීමේ දී වෙනත් නාලිකා ද නරඹන්නො වෙති. මෙයින් පැහැදිලි වන්නේ මාධ්‍යවල දේශපාලන පක්ෂපාතීත්වය නිසා පැහැදිලි මහජන මතයක් ගොඩ නැගීමට බාධා පමුණුවන බවයි. ජන මාධ්‍ය මගින් ආණ්ඩු පත් කිරීමට සහ ඒවායේ පැවැත්මට බලපෑම් කරන බව ප්‍රතිචාරීන් 74% ක් අදහස් දැක්වූ අතර සියලූම රූපවාහිනි නාලිකා තම දේශපාලන මතවාදය අනුව ආණ්ඩු පක්ෂයට හෝ විපක්ෂයට පක්ෂග්‍රාහීව කටයුතු කරන බවට 93.5% ක් අදහස් දක්වා ඇත.

මුඛ්‍ය පදඃ රාජ්‍ය මාධ්‍ය, 2015 ජනාධිපතිවරණය, මහජන මතය

1. ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
2. ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය